**කරෙයිනගර් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දි නොමැත. |

### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු සුසාන භූමි 03 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | සුසාන භූමි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | සුසාන භූමි වටිනාකම් තක්සේරු කර අවසන් ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | කාර්යසාධන වාර්තාව සකස් කළ නමුත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට නොහැකි විය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | III පරිච්ඡේදයේ 32 වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දේපළ 8,707ක ප්‍රමාණයක් පැවතුණද, සභාව මේ දක්වා වරිපනම් හා බදු තක්සේරු කර නොතිබුණි. | වරිපනම් හා බදු තක්සේරු කළ යුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය හේතුවෙන් දේපළ තක්සේරු කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණි. |
| (ii) | X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කළ යුතු වේ. | අයවැය සැලැස්ම සමග සසඳා වාර්තා සකස්කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | සභාව විසින් ලබාදී තිබු රු. 215,928 ක් වටිනා අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව නිරවුල් කළ යුතු වේ. | අත්තිකාරම් රු. 215,928 ක් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | පළාත් පාලන මූල්‍ය හා පාලන රීති මාලා අංක 288 | ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය රහිතව ප්‍රාදේශීය සුභ සාධක සංගමයෙන් සභාව විසින් රු. 2,138,000ක් පරිත්‍යාග ලෙස ලබාගෙන තිබුණි. | පළාත් භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අනුමැතීන් ලබාගත යුතුවේ. | ප්‍රාදේශීය සභා පනත් සහ සභා තීරණ අනුව අරමුදල් ලබාගෙන ඇත. කෙසේවෙතත්, අවශ්‍ය අනුමැතීන් ලබාගනු ලැබේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2002 වර්ෂයේ අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 වැනි වගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශයේ සඳහන් කර ඇති ආකාරයට සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවෙකුට එකතු කළ අගය මත බදු ලෙස රු. 785,068ක් ගෙවීම් කර තිබුණත් එම සැපයුම්කරුගෙන් "වැට් ඉන්වොයිසිය" (VAT Invoice) ලැබී නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු පිළිබඳව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගත යුතුවේ. | කොන්ත්‍රාත්කරුට ලබාදුන් එකතු කළ අගය මත බදු විස්තර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වේ. | දේපළ තක්සේරුවෙන් පසුව අයකිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,934,011 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,186,097 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,000 | - | 10,060 | - | 10,000 | - | 6,750 | - |
| කුලී | 2,202,200 | - | 2,024,131 | - | 2,402,000 | - | 2,775,481 | - |
| බලපත්‍ර ගාස්තු | 269,975 | - | 328,170 | - | 256,800 | - | 289,339 | - |
| වෙනත් ආදායම් | 29,638,381 | - | 33,331,107 | - | 30,752,724 | - | 29,705,071 | - |
| එකතුව | **32,120,556** | **-** | **35,693,467** | **-** | **33,421,524** | **-** | **32,776,641** | **-** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු. 32,776,641 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.35,693,467 කින් වැඩි වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.2,916,826කින් වැඩි වී තිබුණි.<br>එසේ වුවත්, බිල් කළ ආදායම් සහ 2018 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වන ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | ඉදිරි වර්ෂවලදී බිල්කර අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පවතින සුසාන භූමි 05ක් සඳහා සභාව විසින් සංවර්ධන ක්‍රියාමාර්ග සිදු කර තිබුණත්, මළ සිරුරු පිළිස්සීම සඳහා අනුමැතිය ලබා නොමැති අතර ඒ සඳහා සුසාන භූමි බදු ද සභාව විසින් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමි බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුසාන භූමි බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.494,704 ක් සහ මුද්දර ගාස්තු රු.5,416,868ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ හිටිව පවතින උසාවි දඩ මුදල් රු.85,000 ක් සහ මුද්දර ගාස්තු රු.5,200,597ක් අයකිරීමට කටයුතු කෙරේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුභසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරුණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වුවත් 2018 | අදාළ ආඥා පනත අනුව කටයුතු සිදු කළ යුතු වේ. | සියළුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. |

දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සකස් කර තිබුණත් සියළුම කරුණු ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් සකස් කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කෙරේ. |

(ඇ) **මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් 21 කින් ක්‍රියාකාරකම් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් ක්‍රියාකාරකම් සභාවේ නිර්දේශ මත වෙනස් කර තිබුණි. | ක්‍රියාත්මක කළ යුතු සියළුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ක්‍රියාකාරකම් 21ක් සඳහා අරමුදල් නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. |

**(ඈ) අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පාරම්පරික හොජුන් හල සහ ළමා උද්‍යානය සඳහා වැයකළ රු.12,230,000 කින් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කරගෙන තිබුණද, අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පාරම්පරික හොජුන් හල සහ ළමා උද්‍යානය ක්‍රියාත්මක වෙමින් පවතී. |

### (ඉ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිල්ලෙයි සුසාන භූමිය සඳහා ඇස්තමේන්තු කළ රු.2,000,000ක් වටිනා කාර්යයන් 2018 ඔක්තෝබර් 05 දින ආරම්භ කර තිබුණත් අවසන් කර නොතිබුණි. කාලය දීර්ඝ කිරීම සඳහා හේතු පිළිගත නොහැකි ඒවා විය. | ක්‍රියාකාරකම් නියමිත කාලයේ අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලගුණය හේතුවෙන් කාල ප්‍රමාදයන් සිදුවිය. |

### (ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | දෛනිකව රැස් කෙරෙන කසළ කැබලිකර පස්වලින් වසා දැමීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කැබැලි කර පරිසරයට බලපෑම් නොවන පරිදි පස් දමා වැසිය යුතු වේ. | ඝන අපද්‍රව්‍ය රැස්කර වෙන් කර විකුණනු ලබන අතර අනෙකුත් ඒවා පස් දමා වසනු ලැබේ. |
| (ii) | ජාතික ප්‍රතිපත්තිය අනුව ඝන අපද්‍රව්‍ය වෙන් නොකර රැස්කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කළ යුතු වේ. | අනාගතයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ජාතික ප්‍රතිපත්තිය අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු නොවී පැවැතුණි. | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. | අප සභාවට පළාත් පාලන සහකාර වරයෙකු පත් කළ පසු අදාල කටයුතු ඉටු කරනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

සම්පත් 08 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සුළු ණයහිමියන්ට ගෙවිය යුතු රු.1,016,038ක් ගෙවා නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | සුළු ණයහිමියන්ට ගෙවිය යුතු මුදල් ගෙවා නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වේ. | මුදල් ලැබූ වහාම ගෙවා නිරවුල් කිරිමට කටයුතු කෙරේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක WP JR 7318 දරන වාහනය පසුගිය 2012 වර්ෂයේ සිට අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණද, මේ දක්වා අලුත්වැඩියාවන් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ භාවිතයේ පවතින රු.6,390,000 ක් වටිනා වාහනයක අයිතිය සභවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | බදු පදනම මත ලබාගත් අංක WPPF 7712 දරන වාහනයේ අයිතිය බදු කාලය අවසන් වූ පසුව පවරා ගැනීමට කටයුතු කෙරේ. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාව විසින් භාණ්ඩ හා සේවා ක්‍රියාකාරකම් සඳහා | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇත. |

සකස් කළ යුතු වේ. එසේ වුවත්, සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවක වැටුප්, පොළී ගෙවීම්, කොටස් ලාභ, ප්‍රසාද දීමනා, සහනාධාර වැනි වියදම් හිතකරවත් ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව, භාණ්ඩ අවශ්‍යතා සහ මූලධන වත්කම් අලුත්වැඩියා, පැටවුම් හා ගොඩබෑම් සන්නිවේදන සම්බන්ධතා සේවාවන් සහ වෙනත් වියදම්, භාණ්ඩ හා අවශ්‍යතා, සහන සේවා, උපකාරක මුදල්, විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික අහිතකරවත් පැවතුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සේවක වැටුප් වැඩිවීම හේතු වි තිබුණි. |